# විශේෂ මහසභා රැස්වීම් වාර්තාව

**ස්ථානය** - **බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**
**දිනය** - **2018-05-09**
**වේලාව** - **පෙ.ව. 10.30**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. **ජේ**මදාස මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්. එච්. ඒ. කරුණාරත්න මිය |

## 01.නගරයේ පදික වෙළඳුන්ට වෙළදාම් කිරීමට සුදුසු ස්ථානයක් ලබාදීම.

ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් 2018.05.09 දින විශේෂ මහ සභාවක් රැස්කිරීමට හේතු සාධක වූ අරමුණු පහදා දෙමින් නගරයේ පදික වෙළදුන්ට වෙළදාම් කිරීමට සුදුසු ස්ථානයක් ලබාදීම පිලිබඳ හා සාප්පු කඩකාමර කුළී,බස් නැවතුම්පොළ කඩකාමර කුළී හා කාර්පාක් කඩකාමර කුළී පිළිබඳව සාකච්ඡා කර තීරණයක් ගතයුතු බවත් ඒ පිළිබඳ අදහස් හා යෝජනා ඉදිරිපත් කරන ලෙසත් පවසා සිටින ලදී.

මෙහිදී තව දුරටත් අදහස් දක්වමින් නගරයේ මෙතෙක් අක්‍රමවත්ව පැවති පදික වෙළදාම නිසා සිදු වූ මහජන පීඩාව හා නගරයේ සුන්දරත්වයට සිදු වූ හානිය වැළැක්වීමේ අරමුණින් නගරයේ පදික වෙළදුන්ට තම අභිමානය රැකෙන පරිදි වෙළදාම් කටයුතු කරගෙන යා හැකි පරිදි කඩකාමර ලබාදීමට අපේක්ෂා කරන බව පවසා සිටි ගරු සභාපතිතුමා මේ වන විට ඒ සඳහා සුදුසු ස්ථානයක් ලෙස බස් නැවතුම්පොළ වාහන ගාල් කරන ස්ථානයේ කොටසක් සුදුසු බවට තීරණය කර ඇති බවත් ඒ අනුව අඩි 5ක් දිග අඩි 5ක් පළල කඩකාමරයක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල රු.129,185.19 ක් පමණ වන බවත් එවැනි කඩකාමර 32 ක් සකස් කිරීම සඳහා ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා විසින් ගෙනෙන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රි නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා,** නාගරික සංවර්ධන අධිකාරිය මගින් නම් කර ඇති නව නගර සැලැස්මට අනුව ඉහතින් සඳහන් කරන ලද ස්ථානය පාරිභෝගිකන්ගේ වාහන ගාල්කරන ස්ථානයක් ලෙසට සැළසුම් කර ඇති බැවින් මෙම ස්ථානයේ කඩ ඉදිකිරීමට පෙර නාගරික සංවර්ධන අධිකාරිය දැනුවත් කරන ලෙසත් ඔවුන්ගේ එකගතාවය මත කඩ ඉදිකිරීමේ කටයුතු සිදුකරන ලෙසත් පවසා සිටින ලදී. එමෙන්ම මෙම කඩ ලබාදීමේදි නගරයේ මෙතෙක් පදික වෙළදාමේ නිරත පුද්ගලයන්ට හා නගරසභා බල ප්‍රදේශයේ ජීවත්වන පුද්ගලයන්ට ප්‍රමුඛත්වය ලබාදෙන ලෙසත් පවසමින් පදික වෙළෙඳුන්ට අසාධාරනයක් නොවන පරිදි ක්‍රියාකල යුතු බවත් ,තම භාණ්ඩ විකුණාගැනීමට අපොහොසත් වූ වෙළදුන් විශාල වශයෙන් ණය ගෙවා ගැනීමට නොහැකි තත්වයට මුහුන පා ඇති බවත් පවසා සිටි අතර ජාතික ලොතරැයි මණ්ඩලයේ විශාල ආදායමක් රජයට හා ජනාධිපති අරමුදලට ලැබෙන හෙයින් ඒ සඳහා සහන ලබාදිය යුතු බවත් නගරයේ සුන්දරතාවය රැකෙන පරිදි හා වෙළදුන්ට සාධාරණයක් සිදුවන පරිදි කටයුතු කිරිම යෝග්‍ය බවත් පවසා සිටින ලදී.

**ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින්** නගරයේ මහජනතාවට නිදහසේ සැරිසැරීමේ අයිතිය ලබාදීමේ අරමුණින් තමා විසින් ඉහත සභාවකදී ගෙනෙන ලද යෝජනාවක්ද අනුව පදික කඩ ඉවත්කිරීම නගරයේ පැවැත්මට හිතකර තත්වයක් බවත් කෙසේ නමුදු හැකි ඉක්මනින් සුදුස්සන් තෝරා පදික වෙළදුන්ට කඩ ලබාදීමට කටයුතු කරන ලෙසත් මෙහිදී ඉල්ලා සිටින ලදී. එමෙන්ම තව දුරටත් සිදුවෙමින් පවතින නගරයේ වෙළෙද සැල්වල වහළයේ එල්ලා තිබෙන වෙළෙඳ

භාණ්ඩ ඉවත්විය යුතු බවත් නාගරික සංවර්ධන අධිකාරියේ හා මාර්ග සංවර්ධන අධිකාරියේ එකඟතාවය මත මෙම කටයුතු කරගෙන යාම සුදුසු බවත් ,පදික වෙළඳුන්ට කඩ ලබාදීමේදි විනිවිද භාවයෙන් යුතුව ලබාදීමට කටයුතු සලසන ලෙසත් පවසා සිටින ලදී.

**මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා** මහජනතාවට පීඩාව වැළැක්වෙන පරිදි වෙළෙඳ සැල්වල එල්ලා තිබෙන භාණ්ඩ සුදුසු පරිදි ස්ථානගත කිරීමට ක්‍රමවේදයක් සැලසීම සුදුසු බවත් පදික වෙළෙඳුන්ට කඩ ලබාදීමේදි මහජනතාව ගැවසෙන ස්ථානයක් ලබාදීමට කටයුතු කරමින් සැමට සාධාරණයක් වන පරිදි මෙම ගැටළුවට විසඳුම් සෙවිය යුතු බවත් පවසා සිටින ලදි.

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.ප්‍රේමදාස මහතා අදහස් දක්වමින්** මෙය ඉතා කාලෝචිත ප්‍රශ්නයක් බවත් පැල්පත්වාසී ගැටළුව මෙන්ම පදික වෙළඳුන්ගේ ගැටළුව රට පුරා පවතින ගැටළුවක් බවත්,පදික වෙළඳුන්ට වෙනත් සුදුසු ස්ථානයක් වෙළඳාම් කිරීමට ලබාදෙනවා මෙන්ම නැවත ඔවුන් සුපුරුදු ස්ථාන කරා පැමිණේදැයි නිරන්තර විමසිල්ලෙන් සිටිය යුතු බවත් පවසා සිටින ලදී. ආත්මවාසිය තකා සුදුස්සන්ට සුදුසු දේ නොදී, තම පාක්ෂිකයන්,හිත මිත්‍රයන්,ඥාතීන් තෝරා සම්පත් බෙදා දුන්නාක් මෙන් නොවී ලැබිය යුතු සුදුස්සාටම පක්ෂ පාට ,හිත මිතුරුකම් නොසළකා සාධාරණ පරිදි මෙම පදික කඩ ලබාදෙන ලෙස ගරු සභාවට පවසා සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු **නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා**,පදික වෙළෙඳාම යන්න මුළු ලෝකයේම පවතින ප්‍රශ්නයක් බවත් පෙර පැවති සභාවලදී මේ පිළිබඳ සාකච්ඡා කර තිබුනද සාර්ථක විසඳුම් ලබාගැනීමට නොහැකි වූ බවත් කුමන ක්‍රියාමාර්ගයක් ගත්තද එමගින් ජනතාවට සිදුවන පීඩාවන් අවම වන පරිදි කටයුතු කල යුතු බවත් පවසා සිටින ලදී.පදික වෙළඳුන් ඉවත් කිරීමට ගත් වෑයම නගරයට යහපත් ක්‍රියාවක් බවත් ඔවුන්ට වෙළෙඳ කුටි ලබාදීමෙන් පසුව පදික වෙළඳුන් ඉවත් කිරීම සිදුකලේ නම් එය වඩාත් යහපත් බවත් සභාවට පැවසූ ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා ආර්ථික ප්‍රශ්න හා ණය බරින් මිරිකී සිටින මෙම වෙළඳුන් සඳහා වෙළෙඳ කුටි ලබාදෙන තෙක් පදික වෙළෙඳාම කරගෙන යාමට ඉඩලබාදෙන ලෙසත් ඉදිකිරීම් කටයුතු සිදුකිරීමේදි නාගරික සංවර්ධන අධිකාරියේ එකඟතාවය මත සිදුකරන ලෙසත් ගරු සභාවට පවසා සිටින ලදී.

**ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා අදහස් දක්වමින්** මෙය ගැටළුවක් හා අවශ්‍යතාවයක් යන දෙයාකාරයෙන් සාකච්ඡා කල හැකි මාතෘකාවක් බවත්, නගරයේ වෙළෙඳ ව්‍යාපාරිකයන් මෙන් නොව පදික වෙළඳුන් එදිනෙදා ජීවිකාව ගෙන යාමට වෙළඳාමේ නිරත පුද්ගල පිරිසක් බැවින් ඔවුන් කෙරෙහි

වැඩි අවධානයක් යොමුකල යුතු මෙන්ම මෙතෙක් පැවති මෙම අනවසර වෙළඳාම හා,නගරයේ බිම කුලියට දෙමින් අනිසි ලෙස මුදල් ඉපයීම වැනි අයථා කටයුතු මින් මතුව සිදු නොවීමට වගබලා ගත යුතු බවත් පවසා සිටින ලදී. එබැවින් මෙහිදී අවස්ථාවාදී දේශපාලනයට හෝ පක්ෂ, ජාති භේද සඳහා ඉඩ නොදී සුදුස්සාටම ලැබිය යුතු පරිදි මෙම කඩ ලබාදීමට වැඩපිළිවෙලක් සකස් කරමින් පවතින බවත් එය නිසි ක්‍රමවේදයකට ලබාදීම අප සැමගේ වගකීමක් බවත් පෙන්වා දෙන ලදී.මෙහිදී තවත් ගැටළුවක් ලෙස පදිකයන්ට මාර්ගයේ ගමන් කිරීමට අවහිර වන පරිදි වෙළෙඳ සැල් ඉදිරිපස හා වහලේ එල්ලා ඇති භාණ්ඩ හා වෙළෙඳ සැල්වල නාම පුවරු මාර්ගය අවහිර වන සේ ස්ථානගත කර තිබීම නිසා සිදුවන අවහිරතාවය පෙන්වා දුන් ගරු උප සභාපතිතුමා විසින් මෙම තත්වය වැළැක්වීම සඳහාද ගරු සභාවක් ලෙස පිළියම් ගත යුතු බව පෙන්වා දෙන ලදී.

**මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා** මින්පසු නගරයේ මෙවැනි කටයුතු ක්‍රියාත්මක කරන්නේ නම් සභාවේ මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටි අතර පදික වෙළඳුන්ට තාවකාලිකව ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා තොග වෙළෙඳ මධ්‍යස්ථානය ලබාදීම යහපත් බවත් හැකිනම් ඉරිදා දිනවලදීද වෙළෙඳාම සඳහා මෙම ස්ථානය ලබාදෙන ලෙසත් පවසා සිටින ලදී.එමෙන්ම අනිසි ලෙස රුපියල් පන්සියය රුපියල් හයසීය වැනි මුදලට නගරයේ බිම අත්පත් කර ගෙන කුළියට ලබාදීම වැනි අයථා කටයුතු නැවැත්වීමට ක්‍රියා කරන ලෙස පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා පදික වෙළෙඳුන්ට කඩ ලබාදීමේදී විනිවිද භාවයෙන් යුතුව සුදුස්සන් තෝරා කඩ ලබාදෙන මෙන් පවසා සිටින ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා** විසින් අදහස් දක්වමින් රථ වාහන ගාල් කිරීම සඳහා සැලසුම් කර ඇති ස්ථානයේ පදික කඩ කාමර සෑදූ පසු රථවාහන ගාල් කරන පිරිසට අසාධාරණයක් සිදු නොවේද යන්නෙන් ඇසූ පැනය සඳහා පිලිතුරු සැපයූ ගරු සභාපතිතුමා වාහන ගාල් කිරීම සඳහා වෙනම ස්ථානයක් ඉදිරියේදී ස්ථාපිත කිරීමට සැළසුම් සකස් කර ඇති බැවින් එම පිරිසට ඉන් අසාධාරණයක් සිදු නොවන බව පවසා සිටින ලදී.

මේ පිළිබඳ අවසාන වශයෙන් අදහස් දක්වූ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා පදික වෙළඳුන්ට සහ ඔවුන්ගේ දරුවන්ට ආත්ම ගෞරවය රැකෙන පරිදි ආත්මාභිනායෙන් යුතුව ජීවිකාව ගෙන යාම සඳහා මෙය මහඟු අවස්ථාවක් බවත් ඒ සම්බන්ධ කටයුතු කිරිමේදි පක්ෂ පාට හිත මිතුරුකම් කිසිවක් අදාළ කර නොගන්නා අතර ලැබිය යුත්තාට ලැබිය යුතුදේ ලබාදීම තම වගකීම කොට සළකා ක්‍රියාකිරීමට කැපවී සිටින බවත් එය නුදුරු අනාගතයේ සිදුකිරීම තම අපේක්ෂාව බවත්

පවසා සිටින ලදී. එහෙයින් සභාවේ කිසිවෙකුගේ විරෝධයක් මේ සම්බන්ධව නොමැති හෙයින් මෙම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

## 02.සාප්පු කඩකාමර කුළී,බස් නැවතුම්පොළ කඩකාමර කුළී හා කාර්පාක් කඩකාමර කුළී පිළිබඳව සාකච්ඡා කිරීම.

### 02:01 සාප්පු කඩකාමර කුළී

සාප්පු කඩකාමර කුළී අඩුකිරීම සම්බන්ධයෙන් සාප්පු කඩහිමියන් විසින් කරන ලද බලවත් ඉල්ලීම සළකා, 2018.04.05 දින පැවති සභා වාරයේදි ගනු ලැබූ තීරණය ගණනය කිරීමේදි සිදුව ඇති දෝෂය හේතුවෙන් එම තීරණය අවලංගු කිරීමටත්,සාප්පු කඩ කාමර කුළිය දැනට අයකරනු ලබන මුදල පදනම්ව ඉන් 10%ක බැගින් පසුගිය වසර 8ක් පදනම්කර ගෙන වාර්ෂිකව ගණනය කර අයකිරීමටත් ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී.මෙහිදී අදාළ මුදල රු.13,564.60 වන අතර එය රු.13,500 සේ සළකා අයකිරීමට සුදුසු බවටද එම මුදල් 2018 ජූනි මස සිට අයකිරීමට සුදුසු බවද ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර මෙම මුදලට අමතර රජයේ සියළුම බදු මුදල් මෙයට එකතු වන බවත් එසේම මෙතෙක් ලැබිය යුතුව ඇති සියළුම හිඟ මුදල් කපා හැරීම සුදුසු බවත් ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

### 02:02 බස්නැවතුම්පළ කඩකාමර කුළී

බස් නැවතුම්පළ කඩකාමර සම්බන්ධයෙන් අදහස් දැක්වූ ගරු සභාපතිතුමා පෙර ගෙවුම් මුදල් ගෙවා ඇති කඩකාමර සඳහා 2018.04.11 දිනට සිදුකරන ලද තක්සේරු මුදල ක්‍රියාත්මක කිරීමටත් පෙර ගෙවුම් මුදල් (keymoney)නොගෙවන ලද කඩකාමර සඳහා 2015.09.22 දිනට අදාළ තක්සේරුව ක්‍රියාත්මක කිරීම සුදුසු බව යෝජනා කල අතර මෙම තක්සේරුව ක්‍රියාත්මක කිරීම 2018 ජූනි සිට ක්‍රියාත්මක කිරීමටත් සියළුම හිඟ මුදල් කපාහැරීම සුදුසු බවත් යෝජනා කරන ලද අතර ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

### 02:03 කාර්පාක් කඩකාමර කුළී

කාර්පාක් කඩකාමර කුළී සඳහා 2018.05.01 දිනට ද තක්සේරු මුදල අයකිරීම සුදුසු බවත් එය 2018 ජූනි මස සිට ක්‍රියාත්මක කිරීම සුදුසු බවටත් සියළුම හිඟ මුදල් කපාහැරීම සුදුසු බවත් ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා සඳහන් කල පරිදි මෙතෙක් ලැබිය යුතුව ඇති සියළුම හිඟ මුදල් කපා හැරීම සඳහා සභාව සතුව බලතල පවතීදැයි ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා විසින් අසන ලද පැනයට පිළිතුරු සැපයීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් සභාව කාරක සභා අවස්ථාවක් බවට පත්කරන ලදී.එහිදී මේ පිළිබඳ ගණකාධිකාරිතුමා හා ලේකම්තුමිය විසින් පැහැදිලි කරන ලද විස්තර පදනම්කර ගෙන ගරු සභාපතිතුමා විසින් අධිකරණ තීන්දුවක් නොවේ නම් හිඟ මුදල් කපාහැරීම සඳහා සභාවට තීන්දු තීරණ ගත හැකි බවත්,එය ක්‍රියාත්මක කිරීමේදි ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට යටත්ව සිදුකල යුතු බවත් රු.1000.00 ඉක්මවන වියදම් කපාහැරීම සඳහා සභාව විසින් අනුමත කරගනු ලබන තීරණ ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට යටත්ව සිදුකල යුතු බවත් පවසා සිටින ලදී.

මේ පිලිබඳ අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා හිඟය කපාහැරීමට විරුද්ධත්වයක් නොමැති වුවත් මේ පිලිබඳ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබාගෙන සිදුකරන ලෙස පවසා සිටින ලදී.ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.ප්‍රේමදාස මැතිතුමාද අදහස් දක්වමින් සභාවට අයවිය යුතු විශාල මුදලක් කපා හැරීමක් බැවින් නිළධාරින්ට පවා අධිභාරයකට හේතුවිය හැකි නිසා ආණ්ඩුකාරවරයාගේ උපදෙස් පරිදි සිදු කිරීම සුදුසු බව පවසා සිටින ලදී. මේ සඳහා අදහස් ප්‍රකාශ කල ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා සියළුදෙනා එක්ව මෙම තීරනය සභාවේ ඒකමතිකව සම්මත කර ගත් පසු එම ඉල්ලීම ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට යැවීම සිදුකල හැකි බව පවසා සිටින ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා මේ සඳහා සභාවේ කිසිවෙකුගෙන් විරෝධයක් තිබේදැයි අසන ලදුව ඒ සඳහා විරෝධතා නොදක්වූ හෙයින් ඉහත ගනුලැබූ තීරණය සභාවේ ඒකමතිකව සම්මත විය.

ගරු සභාපතිතුමා විසින් ප.ව. 1 .30 ට පමණ මෙදින මහ සභා රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

චමික ජයමිණි විමලසේන,

සභාපති,

බළන්ගොඩ නගර සභාව.